# රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
## දේශීය ණය සහ සංවර්ධන අරමුදල
# පුරප්පාඩු සඳහා අයදුම්පත් කැඳවීම

දිවයිනේ පළාත් පාලන ආයතනවල ප්‍රාග්ධන ආයෝජනය සහ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය ණය පහසුකම් සැපයීම සහ ණය ආපසු අයකිරීමේ ප්‍රධාන කාර්යභාරය ඉටුකරන දේශීය ණය සහ සංවර්ධන අරමුදල වර්ෂ 1916 අංක 22 දරන ආඥා පනත යටතේ පිහිටුවන ලද ව්‍යවස්ථාපිත ආයතනයක් වන අතර, මෙම අරමුදල රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය යටතේ පාලනය වේ. මෙම ආයතනයේ පහත සඳහන් තනතුරු ඇබෑර්තු සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**කළමනාකරණ සහකාර**

**(පුරප්පාඩු සංඛ්‍යාව - 03)**

**01. සේවා ගණය : කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන)**

**02. සේවා ගණයට පැවරෙන කාර්යයන්හි ස්වභාවය පිළිබඳ පොදු නිර්වචනය**

ආයතනයන්හි විධායක හා පරිපාලන මට්ටම්වල නියුතු වූවන්ගේ කාර්යයන්ට උපස්ථම්භක හා / හෝ පහසුකාරක කර්තව්‍යයන් අතුරින් තාක්ෂණික ස්වභාවයේ නොවන්නාවූ කාර්යයන් මෙම සේවා ගණයට පැවරේ. මෙම ගණයේ කාර්යයන් අතුරින් පත්වීම් බලධාරියා විසින් සුවිශේෂී කොට දක්වනු ලබන කාර්යයන් මෙම සේවා ගණයට අයත් සේවකයින් විසින් ඉටු කරනු ලැබිය යුතුය.

**03. සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන් සඳහා**

**අධ්‍යාපන**

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී

i. සිංහල / දෙමළ

ii. ගණිතය

යන විෂයයන් ඇතුළුව විෂයයන් හතර (04) කට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හය (06) කින් සමත්ව තිබීම.

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් තුනක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා**

(අ) ප්‍රාථමික ශ්‍රේණිය – ශිල්පීය නොවන සහ ශිල්පීය සේවා ගණයන්හි පහත 'ආ', 'ඇ' සහ 'ඉ' සඳහන් සුදුසුකම් ඇති සේවකයින්ට මේ සඳහා අයදුම් කළ හැකිය.

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී

i. සිංහල / දෙමළ

ii. ගණිතය

යන විෂයයන් ඇතුළුව විෂයයන් හතර (04) කට සම්මාන සාමාර්ථයන් සහිතව විෂයයන් හය (06) කින් සමත්ව තිබීම.

(ඇ) සේවයෙහි ස්ථිර පත්වීම් දැරිය යුතු අතර, එම පත්වීම්වල ස්ථිර කරනු ලැබ සිටිය යුතුය.

(ඉ) නියමිත දිනට පූර්වාසන්නව ස්ථිර පත්වීමක යටත් පිරිසෙයින් අවුරුදු 05 ක අඛණ්ඩ, සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතුය.

**04. වයස් සීමාව**

අවු : 18 ට නොඅඩු හා අවු : 45 ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**05. වැටුප් පරිමාණය**

මෙම තනතුර කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලැබූ බඳවා ගැනීමේ සහ උසස් කිරීමේ පරිපාටිය අනුව අනුමත තනතුරකි.

සේවා ගණයට අදාළ වැටුප් කේත අංකය හා මාසික වැටුප් පරිමාණය:

2025.01.01 දින සිට

MA 1-1-2025: රු. (46,220 - 10 X 540 - 7 X 630 - 4 X 890 - 20 X 1,190 - 83,390)

(රජයේ අනුමත දීමනා එකතුවේ)

ප්‍රධාන කාර්යාලයේ සේවය සඳහා පමණක් බඳවා ගන්නා බැවින් ආසන්න පදිංචි අයදුම්කරුවන් හට ප්‍රමුඛතාවය හිමි වේ.

බඳවාගැනීම සම්මුඛ පරීක්ෂණයක් මගින් සිදුකෙරේ.

**සේවා කොන්දේසි**

i. මෙම තනතුර ස්ථිර වන අතර වසර 03 ක පරිවාස කාලයකට යටත් වේ.

ii. සේවක අර්ථ සාධක අරමුදල සඳහා සේවකයා විසින් වැටුපෙන් 8% ක් ගෙවිය යුතු අතර, සේව්‍යයා විසින් 12% ක් සහ සේවක භාරකාර අරමුදල සඳහා 3% ක් ද ගෙවනු ලැබේ.

අයදුම්පත් අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී, දේශීය ණය සහ සංවර්ධන අරමුදල, අංක 24 /ඒ, වෝඩ් පෙදෙස, කොළඹ 07 යන ලිපිනයට 2026.02.10 දිනට හෝ ඊට පෙර ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පතේ ඉහළ කෙළවරේ අදාළ තනතුර සඳහන් කළ යුතුය.

**සභාපති,**
**දේශීය ණය සහ සංවර්ධන අරමුදල.**